සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 8 - 2017

**නම : ............................................** **ඉතිහාසය** **කාලය : පැය 2යි.**

**සැලකිය යුතුයි:**

v සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

v **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.**

(1) පණ්ඩුකාභය රජුගේ අනුග්‍රහය යටතේ ඉදිකළ වැවකි.
(i) බානුවාපී (ii) අභයවාපී (iii) ජල්ලුරවාපී (iv) පාදූලකවාපී

(2) ශිලා ලිපිවල සඳහන් පරිදි ලෝහ වැඩවල නිරත වූ තැනැත්තා හැඳින්වූයේ පහත සඳහන් කුමන නමින් ද?
(i) තොපෂ (ii) තඹර (iii) මණිකර (iv) කබර

(3) උඩරට රාජධානියේ ආරම්භක පාලකයා වූයේ පහත සඳහන් කුමන රජු ද?
(i) VI පරාක්‍රමබාහු (ii) I විමලධර්මසූරිය
(iii) සේනාසම්මත වික්‍රමබාහු රජු (iv) ජයවීර බණ්ඩාර රජු

(4) 16 වන සියවස ආරම්භයේදී ලංකාවට පැමිණි යුරෝපී ජාතිය වන්නේ
(i) ඉංග්‍රීසින් (ii) ලන්දේසින් (iii) පෘතුගීසින් (iv) ප්‍රංශ ජාතීන්

(5) පුනරුද සමයේ දී ප්‍රංශයේ ආරම්භ වූ විශ්ව විද්‍යාලයකි,
(i) පැරිස් (ii) පාදුවා (iii) කේම්බ්‍රිජ් (iv) ඔක්ස්ෆර්ඩ්

v **අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරිනම් (3) ලකුණ ද වැරදි නම් ( 8 ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

(6) දෙමළ මහා සෑය I පරාක්‍රමබාහු රජුගේ සමයේදී නිර්මාණය කරන ලද්දකි. ( )

(7) කොනප්පු බණ්ඩාර රජු I විමලධර්මසූරිය නමින් උඩරට රජවිය. ( )

(8) දළදා මාලිගාවට පත්තිරිප්පුව එකතු කළේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය. ( )

(9) මහා අස්ථාන කුමරුගේ පියා සෙනරත් රජු ය. ( )

(10) පුනරුද සමයේ කලා ශිල්ප වල ස්වභාවය ආගමික මුහුණුවරක් ගෙන තිබුණි. ( )

v **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

(11) මහාවංශයේ සඳහන් වන ආකාරයට මහමෙවුනා උයන තනවන ලද්දේ ....................................... රජුය.

(12) කුඩා දාගැබ් ආවරණය කිරීමට හැදූ ගෘහ ......................................... ලෙස හැඳින්වේ.

(13) උඩරට රාජධානියේ බලයට පත් වූ පළමු නායක්කාර් වංශික රජු ...................................... රජුය.

(14) පුනරුදය ඇති වීමට එක් ප්‍රබල හේතුවක් වූයේ .................................................. නගරය තුර්කීන් අතරට පත්වීමයි.

(15) ඉංග්‍රීසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගන්නා විට උඩරට පාලකයා වූයේ ........................................ රජු ය.

(චේතියඝර, රාජාධිරාජසිංහ, කොන්ස්තන්තිනෝපල්, බෝධිඝර, ශ්‍රී විජය රාජසිංහ, වැනීසිය, මුටසීව)

v **අංක 16 සිට 20 දක්වා (A) තීරුවේ සඳහන් තොරතුරු හා සම්බන්ධ පිළිතුර (B) තීරුවෙන් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

| | A | | B |
|---|---|---|---|
| (16) 1. | ථූපාරාමය | A. | නිශ්ශංකමල්ල රජු |
| 2. | ජේතවනාරාමය | B. | දේවානම්පියතිස්ස රජු |
| 3. | දැදිගම කොටවෙහෙර | C. | මහසෙන් රජු |
| 4. | රන්කොත් වෙහෙර | D. | I පරාක්‍රමබාහු රජු |

(i) BADC (ii) BCDA (iii) BDAC (iv) BDCA

| | A | | B |
|---|---|---|---|
| (17) 1. | මූර්ති කලාව | A. | ධ්‍යාන මුද්‍රාව |
| 2. | බුද්ධ ප්‍රතිමා | B. | පාර්වතී |
| 3. | කැටයම් කලාව | C. | ආලාහන පිරිවෙන |
| 4. | ආරෝග්‍ය ශාලා | D. | සඳකඩ පහන |

(i) BADC (ii) ADCB (iii) DABC (iv) CDAB

| | A | | B |
|---|---|---|---|
| (18) 1. | පොළොන්නරුව | A. | ඇත් පොකුණ |
| 2. | අභයගිරිය | B. | නෙළුම් පොකුණ |
| 3. | සීගිරිය | C. | රන්මසු උයන |
| 4. | ඉසුරුමුණිය | D. | ජල උයන |

(i) ABDC (ii) DBAC (iii) BADC (iv) BCAD

| | A | | B |
|---|---|---|---|
| (19) 1. | සේනාසම්මත වික්‍රමබාහු | A. | උඩරට රාජධානියේ දීර්ඝතම කාලයක් පාලනය ගෙනයාම |
| 2. | II විමලධර්මසූරිය | B. | උපාලි හිමි ප්‍රමුඛ භික්ෂූන් මෙරටට ගෙන්වීම. |
| 3. | II රාජසිංහ | C. | ලන්දේසින් සමග සුහදව කටයුතු කිරීම. |
| 4. | කීර්ති ශ්‍රී රාජසිංහ | D. | කෝට්ටේ පාලන බලයෙන් උඩරට නිදහස් කරගැනීම |

(i) DCAB (ii) BCDA (iii) DACB (iv) BACD

| | A | | B |
|---|---|---|---|
| (20) 1. | ඩාන්ටේ | A. | එංගලන්තය |
| 2. | විලියම් ශේක්ෂ්පියර් | B. | ජර්මනිය |
| 3. | ඉරාස්මස් | C. | ප්‍රංශය |
| 4. | මාටින් ලූතර් | D. | ඉතාලිය |

(i) ADCB (ii) DACB (iii) DCAB (iv) BCAD

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුලත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01)



(A) (i) මෙම පින්තූරයේ සිටින පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.
(ii) එතුමාගේ මුල් නාමය කුමක්ද?
(iii) එතුමාගේ සමයේදී ලංකාවට පැමිණි විදේශීය ජාතිය නම් කරන්න.
(iv) දියෝගු ද මේලෝගේ හමුදාව හා මෙතුමාගේ හමුදාව අතර සටනක් ඇති වූ ස්ථානය නම් කරන්න.
(ලකුණු 4)




(B) (i) මෙම නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.
(ii) මෙය පිහිටා ඇත්තේ කුමන නගරයක ද?
(iii) වංශකතා වලට අනුව මෙය මහල් කීයකින් සමන්විත වී තිබේද?
(iv) මෙම සැලසුමට අනුව ඉදිකල කුඩා මාලිගාවක් හමුවන්නේ කුමන ස්ථානයකින් ද? (ලකුණු 4)



(C) (i) මෙම නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.
(ii) මෙය නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා නම් කරන්න.
(iii) එතුමා විසින් නිර්මාණය කරන ලද වෙනත් ප්‍රසිද්ධ චිත්‍රයක් නම් කරන්න.
(iv) චිත්‍ර ශිල්පියෙකුට අමතරව ඔහු කුසලතා පෙන්වූ වෙනත් ක්ෂේත්‍රයක් නම් කරන්න. (ලකුණු 4)

(D) (i) දී ඇති උපකාරක පද උපයෝගී කරගෙන පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට
1. මැටි කර්මාන්තයේදී භාවිතා කරන උපකරණයකි.
2. දුටුගැමුණු රජු විසින් ඉදිකරන ලද ආගමික ස්ථානයකි.

පහළට
1. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු රජ වීමට පෙර භාවිතා කළ නාමය
2. මහ වැව් තැනීමේ ආරම්භක පාලකයා

(ලකුණු 4)

(02) (i) අතීතයේදී මෙරට උයන් තැනවීම සම්බන්ධයෙන් මූලිකත්වය ගත් රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත සඳහන් වාරි නිර්මාණ හා සම්බන්ධ රජවරු නම් කරන්න.
a. තල්වතු ඇළ -
b. ඇලහැර ඇළ -
c. යෝධ ඇළ -
d. මිනිපේ ඇළ - (ලකුණු 4)

(iii) පහත දක්වෙන්නේ වැවක දැකිය හැකි ප්‍රධාන අංග 2කි. ඉන් සිදුවන කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න.
a. සොරොව්ව -
b. රළපනාව - (ලකුණු 4)

(03) (i) උඩරට සමාජ ක්‍රමය සැකසී තිබූ සමාජ ස්ථර 3 නම් කරන්න. (ලකුණු 3)

(ii) මහනුවර යුගයේ කෘෂිකර්මාන්තය සැකසී තිබූ ප්‍රධාන ක්ෂේත්‍ර 4 ලියා දක්වන්න. (ලකුණු 4)

(iii) උඩරට පාලනය කළ පාලකයන් අතරින් පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පාලකයින් පිළිවෙළින් නම් කරන්න.
a. ලන්දේසින්ගෙන් නැව් ලබාගෙන සියමයෙන් භික්ෂූන් ගෙන්වා උපසම්පදා උත්සවයක් පැවැත්වීම.
b. කන්ද උඩරට පාලනය කළ අවසාන රජතුමා.
c. I රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කළ විට පෘතුගීසි රැකවරණය පැතූ උඩරට පාලකයා.
d. දෝන කතිරිනා විවාහ කර ගනිමින් උඩරට රජ උරුමය ලබාගත් පාලකයා. (ලකුණු 4)

(04) (i) මහනුවර රාජධානිය හඳුන්වන වෙනත් නම් 3ක් ලියා දක්වන්න. (ලකුණු 3)

(ii) උඩරට රාජධානියට ස්වභාවික ආරක්ෂාව භූගෝලීය පිහිටීම් වලින් සැලසී තිබුණි.
a. මහනුවර රාජධානියට ස්වභාවික ආරක්ෂාව සැපයූ කඳු වැටි 2ක් නම් කරන්න. (ලකුණු 2)
b. මහනුවර රාජධානියට පැමිණීමට අතීතයේදී භාවිතා කළ දුර්ග මාර්ග 2 නම් කරන්න. (ලකුණු 2)

(iii) I විමලධර්මසූරිය රජුගේ සේවාවන් 2ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

(05) (i) යුරෝපයේ ඇති වූ පුනරුදයෙන් පසු ලෝකයේ ගමන් මග වෙනස් විය. පුනරුදය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
a. පුනරුදය මුලින්ම ආරම්භ වූ රට කුමක්ද?
b. පුනරුදය ලෙස සැලකෙන්නේ කුමන ශිෂ්ටාචාරයක ලක්ෂණ නැවත පණ ගැන්වීමක් ද?
c. පුනරුදය ඇති වීමට පෙර යුගය හැඳින්වූ නම කුමක්ද? (ලකුණු 3)

(ii) පුනරුදයට පසුබිම් වූ හේතු 4ක් දක්වන්න. (ලකුණු 4)

(iii) පහත වගුව සම්පූර්ණ කරන්න.

| පුනරුද සමයට පෙර කලා ශිල්පවල ලක්ෂණ | පුනරුද සමයේ කලා ශිල්පවල ලක්ෂණ |
|---|---|
| 1 ........................................<br>2 ........................................ | 1 ........................................<br>2 ........................................ |

(ලකුණු 4)

(06) (i) පහත a, b, c යටතේ දක්වෙන්නේ පුනරුද සමයේ බිහි වූ ප්‍රසිද්ධ විශ්ව විද්‍යාල කිහිපයකි. ඒවා අයත් රටවල් නම් කරන්න.

a. පාදුවා -
b. කේම්බ්‍රිජ් -
c. ඔක්ස්ෆර්ඩ් - (ලකුණු 3)

(ii) පුනරුද සමයේ දියුණුවට පත් වූ පහත කලා ක්ෂේත්‍ර වලින් බිහි වූ නිර්මාණ සම්බන්ධව උදාහරණ 2 බැගින් ලියන්න.

චිත්‍ර කලාව - 1. ............................................ 2. ........................................
මූර්ති කලාව - 1. ............................................ 2. ........................................ (ලකුණු 4)

(iii) පුනරුද සමයේ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ දියුණුවක් සිදුවිය. පහත සොයා ගැනීම් කළ විද්‍යාඥයන් නම් කරන්න.

a. පෘථිවිය ගෝලාකාර බව හා පෘථිවිය හා අනෙකුත් වස්තූන් සූර්යයා වටා ගමන් කරන බව සොයා ගැනීම.
b. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව.
c. දුරේක්ෂය නිපදවීම.
d. මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව සොයා ගැනීම. (ලකුණු 4)

(07) (i) මහනුවර යුගයේ චිත්‍ර කලාවේ කැපී පෙනෙන ලක්ෂණ 3ක් නම් කරන්න. (ලකුණු 3)
(ii) මහනුවර යුගයේදී ආනයන අපනයන වෙළඳාමක් පැවතුනි. ඒ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය | අපනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය |
|---|---|
| 1 ........................................<br>2 ........................................ | 1 ........................................<br>2 ........................................ |

(ලකුණු 4)

(i) A - මහනුවර යුගයේ සුප්‍රකට කර්මාන්ත 2ක් නම් කරන්න.
B - උඩරට සමාජයේ කැපී පෙනුන විවාහ ක්‍රම 2ක් දක්වන්න. (ලකුණු 4)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

## ඉතිහාසය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| (1) - 2 | (6) ( 4 ) | (11) මුටසීව | (16) 2 |
| (2) - 4 | (7) ( 4 ) | (12) චේතිඝර | (17) 1 |
| (3) - 3 | (8) ( 8 ) | (13) ශ්‍රී විජය රාජසිංහ | (18) 3 |
| (4) - 3 | (9) ( 4 ) | (14) කොන්ස්තන්තිනෝපල් | (19) 1 |
| (5) - 1 | (10) ( 8 ) | (15) රාජාධිරාජසිංහ | (20) 2 |

(ලකුණු 2 x 20 = 40 )

### II කොටස

(01) (A) (i) II රාජසිංහ රජු
(ii) මහා අස්ථාන කුමරු
(iii) ලන්දේසින්
(iv) ගන්නෝරුව

(B) (i) I පරාක්‍රමබාහු රජුගේ මාලිගාව (වෛජයන්ති ප්‍රාසාදය)
(ii) පොළොන්නරුවේ.
(iii) 7
(iv) පඬුවස්නුවරින්

(C) (i) මොනාලිසා
(ii) ලියනාඩෝ ඩාවින්චි
(iii) අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය
(iv) ගෘහ නිර්මාණ, ඉංජිනේරු, කවියෙකු, සංගීතඥයකු

(D) හරහට
1. සකපෝරුව
2. මිරිසවැටිය

පහළට
1. කන්නසාමි
2. වසභ

(02) (i) මුටසීව, වසභ, ගෝඨාභය, I කාශ්‍යප, I අග්බෝ, II පරාක්‍රමබාහු
(ii) a. මහසෙන්
b. වසභ
c. ධාතුසේන
d. I අග්ගබෝධි

(iii) සොරොව්ව - අධි පීඩනයක් සහිතව වැව තුළ ඇති ජලය වැව් බැම්ම හරහා ඇළ මාර්ගය වෙතට ගැනීම.
රළපනාව - වැව් බැම්ම සේදීයාම වැළැක්වීම.

(03) (i) පූජ්‍ය පක්ෂය
ප්‍රභූ පන්තිය
සාමාන්‍ය ජනතාව
(ii) කුඹුරු ගොවිතැන, හේන් වගාව, ගෙවතු වගාව, සත්ත්ව පාලනය.
(iii) a. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
b. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
c. කරලියැද්දේ බණ්ඩාර රජු
d. I විමලධර්මසූරිය රජු

(04) (i) සෙන්කඩගල, කන්ද උඩරට, උඩරට රාජධානිය, කන්දෙ නුවර
(ii) a. උස්වත්ත හා හන්තාන කඳු
b. බලන, හුන්නස්ගිරිය

(iii)
- පෘතුගීසින්ට එරෙහිව කටයුතු කිරීම.
- බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම.
- ලංකාතිලක, ගඩලාදෙනිය වැනි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
- සීතාවක බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම.
- දෙල්ගමුව විහාරයේ කුරහන් ගලක සඟවා තිබූ දළදාව උඩරටට වැඩම කරවීම.

(05) (i) a. ඉතාලිය
b. ග්‍රීක රෝම
c. මධ්‍යතන යුගය

(ii)
- ශාස්ත්‍රීය දියුණුව
- චිත්‍ර, මූර්ති හා ගෘහ නිර්මාණ ශිල්පයේ ඇති වූ ප්‍රගමනය.
- විද්‍යා ක්ෂේත්‍රයේ දියුණුව.
- වෛද්‍ය විද්‍යාවේ දියුණුව.
- දර්ශනය.
- විද්‍යා ක්ෂේත්‍රයේ දියුණුව

(iii)

| පුනරුද සමයට පෙර | පුනරුද සමයට පසු |
|---|---|
| 1. ආගමික මුහුණුවරක් ගැනීම. | * ලෞකිකත්වයට මුල්තැන දීම. |
| 2. පල්ලිය පමණක් කලා නිර්මාණ වලට අනුග්‍රහ දැක්වීම. | * විවිධ ධනවතුන් අනුග්‍රහ දැක්වීම. |
| 3. ස්වාධීනව නිර්මාණ කිරීමට ඉඩක් නොවීම. | * ස්වාධීන දක්ෂතා ඉස්මතු වීම. |
| 4. නිර්මාණ ශිල්ප ශ්‍රේණි නමින් එළි දැක්වීම. | * නිර්මාණ කතෘගේ නමින් එළිදැක්වීම. |

(06) (i) a. ඉතාලිය
b. එංගලන්තය
c. එංගලන්තය

(ii) චිත්‍ර කලාව - මොනාලිසා, අන්තිම භෝජන සංග්‍රහය, සිස්ටයින් දේව මන්දිරයේ අඳින ලද සිතුවම
මූර්ති කලාව - පියෙටා ප්‍රතිමාව, ඩේවිඩ්ගේ ප්‍රතිමාව, ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව

(iii) a. නිකලස් කොපර්නිකස්
b. ජොහැනස් කෙප්ලර්
c. ගැලීලියෝ ගැලිලි
d. විලියම් හාවේ

(07) (i)
- බිත්ති තීරුවලට බෙදා කතාවක් ලෙස පියවරෙන් පියවරට ලිවීම.
- රූප රාමුවට යටින් කතා පුවත විස්තර කිරීම.
- හිස්තැන් පිරවීමට මල් ඇඳ තිබීම.
- සත්ව, මිනිස්, ශාක රූපවල ප්‍රමාණාත්මක ගුණය නොසලකා හැරීම.
- ශාක හා ඛනිජ වලින් වර්ණ සැකසීම.

(ii) අපනයනය - කුරුඳු, ගම්මිරිස්, පුවක්, ඇත්දත්, ඇතුන්, මුතු, මැණික්, බුලත්, පුවක්, කරාබු නැටි, කරදමුංගු, සාදික්කා, මී ඉටි
ආනයනය - අශ්වයින්, රෙදිපිළි, මැටි බඳුන්, සුවඳ වර්ග, කරවල,

(iii) a. පිත්තල, පත්, ලාක්ෂා, යකඩ, මැටි
b. දීග විවාහය, බින්න විවාහය.